# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2466/50 - 2025 දෙසැම්බර් මස 13 වැනි සෙනසුරාදා - 2025.12.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු ආඥා පනත යටතේ නිවේදනයයි**

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2025)

රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2025 දෙසැම්බර් මස 05 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **හර්ෂණ සූරියප්පෙරුම,**
ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව *ගැසට් පත්‍රයෙහි* නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

1A - G 45927 — 38 (2025/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| සං. ව. ශීර්ෂය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරු බදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය | සාමාන්‍ය | |
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **71.03** | | | **වැඩ දැමූ හෝ නොදැමූ, වර්ග කළා වූ හෝ නොකළා වූ, නමුත් අමුණා නැති සවි නොකළා වූ හෝ නොබැඳි අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ-අනගි මැණික්; ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා තාවකාලික සවි කළා වූ, වර්ග නොකළ, අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ-අනගි මැණික් වර්ග.** | | | |
| | | - | වැඩ නොදැමූ හෝ ඉරීම පමණක් කළා වූ හෝ රළු ලෙස හැඩ ගැන් වූ | | | |
| | 7103.10.10 | --- | අනගි මැණික් ගල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SG) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |
| | 7103.10.20 | --- | අර්ධ අනගි මැණික් ගල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SG) නිදහස් | නිදහස් | කි.ග්‍රෑ. |

EOG 12 - 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.